**ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අනුගමනය කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිගනිමි |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පාඨකයින් විසින් ආපසු භාර දී නොතිබුණු රු. 102,270 ක් වටිනා පොත් 800 ක වටිනාකම තක්සේරු කර අවසන් පොත් තොගයෙන් අඩු නොකර වත්කම් වශයෙන් ඉදිරිපත් කර තිබුණි. | පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර එහි වටිනාකම අවසන් පොත් තොගයෙන් අඩුකිරිමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබූ මොන්ටේරෝ රථයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට ගෙන ආ යුතුවේ. | නිවැරදි වටිනාකම තක්සේරු වාර්තා ලැබීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඒමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | රු. මිලියන 276 ක් වටිනා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය 2017 අප්‍රේල් UNOPS ආයතනය විසින් සභාවට භාර දී තිබූ නමුත් මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සියළුම වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | වත්කම්වල නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට ගෙන ඒමට ඉදිරියේදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඈ) | JICA වැඩසටහන මගින් රු. මිලියන 40ක් වටිනා ග්‍රාමීය ජල සම්පාදන සැලැස්ම අංග සම්පූර්ණ කර 2015 මැයි මාසයේ සභාවට පවරා දී තිබුණත් මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සියළුම වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | වත්කම්වල නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට ගෙන ඒමට ඉදිරියේ දී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්මවා තිබූ කල් ඉකුත් වූ රු. 641,548 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආපසු ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට මාරුකිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කල් ඉකුත්වූ තැන්පතු ආදායමට මාරු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 1645 සහ 1646 | සභාව විසින් භාවිතා කරනු ලබන වාහන ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. | මාසිකව ධාවන සටහන් ඉදිරිපත් කළ යුතු වීම. | ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට යැවීම සඳහා උපදෙස් ලබාදී ඇති බව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 27,755,192 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 33,302,965 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ විස්තර පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ආදායම | | දෙසැම්බර් 31 දිනට | | | | දෙසැම්බර් 31 දිනට |
| විස්තරය | ඇස්තමේන්තුගත ආදායම් රු. | බිල්කළ ආදායම් රු. | රැස්කළ ආදායම් රු. | හිඟ ආදායම් රු. | ඇස්තමේන්තුගත ආදායම් රු. | බිල්කළ ආදායම් රු. | රැස්කළ ආදායම් රු. | හිඟ ආදායම් රු. |
| වරිපනම් හා බදු | 1,302,000 | 1,310,000 | 40,500 | 992,081 | 1,004,000 | 992,081 | - | 992,081 |
| බලපත්‍ර ගාස්තු | 13,524,200 | 13,850,000 | 11,117,699 | 3,115,431 | 3,523,001 | 2,786,516 | 2,786,516 | - |
| කුලී හා බදු | 3,312,000 | 3,500,000 | 2,884,752 | - | 14,177,700 | - | 10,022,610 | 3,047,521 |
| අනෙකුත් ආදායම් | 39,405,000 | 40,400,000 | 43,927,762 | 30,476,782 | 39,282,000 | 57,537,601 | 57,537,601 | - |
| එකතුව | **57,543,200** | **59,060,000** | **57,970,713** | **34,584,294** | **57,986,701** | **61,316,198** | **70,346,727** | **4,039,602** |

### 2.2.2 ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ ආරම්භයේදී අයකරගත යුතු හිඟ ආදායම් රු. 5,928,536 ක් වුවත්, එම හිඟය වර්ෂ අවසානයේදී රු. 12,236,158ක් දක්වා වැඩිවී තිබුණි. | හිඟ හිටි ආදායම් අයකර ගත යුතුවේ. | හිඟ හිටි ආදායම් විධිමත්ව අයකර ගැනීමට ඉදිරියේදි කටයුතු කරනු ලැබේ. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු රු. 501,000 ක් ඇස්තමේන්තු කර තිබුණත් ඉන් රු. 35,000 ක් පමණක් අයගෙන තිබුණි. | වරිපනම් හා බදු අයකර ගත යුතුවේ. | ඉදිරියේදි වරිපනම් හා බදු අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.4 කඩ කුලී**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී කඩ කුලී ආදායම් රු. 5,466,012 ක් පමණක් අයකර ගෙන තිබූ අතර හිඟහිටව පැවති වටිනාකම රු. 3,115,432 ක් ව පැවැතුණි. | කඩ කුලී අයකර ගත යුතුවේ. | හිඟ හිටි ආදායම් විධිමත්ව අයකර ගැනීමට ඉදිරියේදි කටයුතු කරනු ලැබේ. |

**2.2.5 වෙළඳ බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී රු. 2,786,516 ක් අයකර ගෙන තිබූ අතර හිඟහිටි කිසිවක් දක්වා නොතිබුණි. | නිවැරදි වටිනාකම ගණනය කර අයකර ගත යුතුවේ. | හිඟ හිටි ආදායම් විධිමත්ව අයකර ගැනීමට ඉදිරියේදි කටයුතු කරනු ලැබේ. |

**2.2.6 විනෝද බදු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සිනමා ශාලාවකින් රු. 992,081ක විනෝද බදු වර්ෂ කිහිපයක සිට අයකර නොමැතිව හිඟහිටව පැවති නමුත් එම සිනමා ශාලාව අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | හිඟ හිටි ආදායම් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | සිනමා ශාලාවෙන් විනෝද බදු අයකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**2.2.7 උසාවි දඩ ගාස්තු හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු. 18,442,076 ක උසාවි දඩ ගාස්තු සහ රු. 12,034,706 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව පැවතුණි. | නියමිත කාලය තුළ අයකර ගැනීමට පියවර ගතයුතු වේ. | උසාවි දඩ ගාස්තු හා මුද්දර ගාස්තු ලබාගැනීමට කටයුතු කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **තිරසාර සංවර්ධන ඉලක්ක**<br>2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. | තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ අනාගතයේදී දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කරඩියනාරු ප්‍රදේශයට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජල සම්බන්ධතාවය ලබාදීම සඳහා 2016 සිට 2018 වර්ෂය දක්වා පළාත් සභා (PSDG) අරමුදල්වලින් රු. මිලියන 4.59 ක් වැයකර තිබූ නමුත් මේ දක්වා ජනතාවට ජලය ලබාදී නොතිබුණි. | වර්ෂ 05කට අධික කාලයක සිට ක්‍රියාත්මක කර නොතිබුණි. කඩිනමින් කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රතිපාදන සලසා ගැනීමෙන් ජලය බෙදාහරිනු ලැබේ. |
| (ආ) | රු. මිලියන 25 සිට රු. මිලියන 30 ක් දක්වා වන පරාසයකින් අතැති මුදල් | සුදුසු ගිණුමකට මාරුකර පොලි ආදායම් | සභාවේ මුදල් සුදුසු ආයෝජනයකට යෙදවීමට කටයුතු කරනු ලැබේ. |

ශේෂ පැවතියද මෙය ඵලදායී ලෙස ලබාගැනිමට කටයුතු ආයෝජනය කර ආදායම් ඉපැයීමට කළ යුතු වේ.
කටයුතු කර නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **පුරප්පාඩු සහ අතිරික්තයන්**<br>සේවකයන් 16 දෙනෙකු අනුමත සේවක සංඛ්‍යාවට වඩා අතිරික්තව පැවැතුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පමණක් සේවක බඳවාගැනීම් සිදු කළ යුතුවේ. | නිලධාරීන් බඳවා ගැනීමේදී අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සැලකිල්ලට ගෙන ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලැබේ. |
| (ආ) | වර්ෂ 05 කට පෙර සේවය හැර ගිය, විශ්‍රාම ගිය, සේවය අත්හිට වූ, ස්ථාන මාරු වී ගිය සේවකයන් 04 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු. 147,776 ක හිඟ ණය මුදල් අදාළ පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදාල පුද්ගලයින්ගෙන් අයකිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දේපළ හඳුනාගෙන වාර්ෂිකව හෝ නැතහොත් කිසියම් කාල පරාසයක් අතරතුර ඒවා තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට වර්ෂ ගණනාවක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වරිපනම් බදු අයකළ යුතුවේ. | දේපළ හඳුනාගෙන ඒවා තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | කඩකාමර 18 ක් සහ දේපළ බදු ගත් අයගෙන් අයකරගත යුතු බදු මුදල් රු. 1,508,889 ක් අයකර ගැනීමට 2009 වර්ෂයේ සිට පියවර ගෙන නොතිබුණි. | බදු මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | බදු මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ඒවා සලකුණු කිරීමට උචිත ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය වන විටත් ගෙන නොතිබුණි. | වත්කම් හඳුනාගෙන ලේඛනගත කළ යුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි සලකුණු කර හඳුනාගෙන ලේඛනගත කිරිමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 3.5.2 නඩත්තුව හා අළුත්වැඩියා සිදුකිරිම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ට්‍රැක්ටර් ට්‍රේලර් බවුසර් දීර්ඝ කාලයක සිට අළුත්වැඩියා නොකර තිබුණි. | කඩිනමින් පියවර ගත යුතුවේ. | අළුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.5.3 වාර්ෂික භාණ්ඩ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික භාණ්ඩ තොග සමීක්ෂණය සමාලෝචිත වර්ෂය සඳහා සිදු කර නොතිබුණි. තවද, පුස්තකාල වර්ෂ 11ක සිට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතුවේ. | වර්තමානයේ සෑම වර්ෂයකම වාර්ෂික භාණ්ඩ තොග සමීක්ෂණය සිදුකරමින් පවතින අතර පුස්තකාලද පසුගිය 2018 වර්ෂයේ සිට මේ දක්වා තොග අයිතමයන් සමීක්ෂණය සිදු කරනු ලැබේ. |

## 3.6 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුස්තකාල 08 ක පාඨකයින් විසින් ආපසු භාර දී නොතිබුණු රු. 102,270 ක් වටිනා පොත් 800 ක් සම්බන්ධයෙන් ඒවා ආපසු ලබාගැනීමට හෝ එහි වටිනාකම අදාල පුද්ගලයින්ගෙන් අයකර ගැනිමට හෝ කටයුතු කර නොතිබුණි. | අදාල පොත් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ආපසු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.7 ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර එයට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුවේ. | දැන් නිවැරදි අයුරින් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර එයට අනුකූලව මිලදී ගැනීම් සිදු කරනු ලැබේ. |

**3.8 මහජන භාවිතය සඳහා විවෘත නොකළ වෙළෙඳ පොළ ගොඩනැගිලි සංකීර්ණ 03**

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුල්ලිමලෙයි, ආයිත්තමලෙයි, කරඩියනාරු වැනි ස්ථානවල වෙළෙඳ ගොඩනැගිලි සංකීර්ණ USAD, NECORD ව්‍යාපෘති මගින් අරමුදල් සපයා ගෙන 2011 සිට 2013 වර්ෂ දක්වා කාල පරාසයේදි ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කර තිබුණි. නමුත් ගොඩනැගිලි සංකීර්ණය මහජන භාවිතය සඳහා භාර නොදි කිසිදු ආදායමක්ද නොලබා නඩත්තු වියදම් පමණක් සිදුකර අතහැර දැමූ තත්ත්වයක පැවතුණි. | මහජන භාවිතය සඳහා විවෘත කළ යුතුවේ. | මෙම ගොඩනැගිලි මගින් ආදායම් වැඩිකිරීමට උත්සාහ කරනු ලබන බව දන්වා සිටිමි. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

**4.2** **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට වරක් හෝ පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. | කාර්තුවකට වරක් කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටු කාර්තුවකට වරක් පැවැත්විමට කටයුතු කරනු ලැබේ. |